# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජූලි මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.07.09 දින නිකුත් කරන ලදී)**


# ඉඩම් සංවර්ධන (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**(464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉඩම් සංවර්ධන (සංශෝධන)

### (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

1. මේ පනත 2024 අංක     දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන වගන්තිය සංශෝධනය කිරීම**

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ 2 (ඇ) උපවගන්තියෙහි ''ඔහුගේ හෝ ඇයගේ විවාහයෙන් අනතුරුව'' යන වචන අවලංගු කිරීම මගින් 48අ වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ වන වගන්තිය සංශෝධනය කිරීම**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ (1) (අ) උපවගන්තිය අවලංගු කිරීම මගින් 48 ආ වැනි වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ 1 වන උපවගන්තියේ ''තමාට හිමිකම් ඇති ඉඩමකට ප්‍රවේශ වීමට අපොහොසත්වන අවස්ථාවක'' යන වචන වෙනුවට ''තමාට හිමිකම් ඇති ඉඩමකට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රවේශ වීමට අපොහොසත්වන අවස්ථාවක'' යන වචන ආදේශ කිරීමෙන් මෙම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.